PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

2025-06-16

ප්‍රවෘත්ති කර්තෘ/ සංස්කාරක,

ඡන්දහිමියන් වීමට සුදුසුකම් ලබන සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ නම් ඡන්දහිමි නාමලේඛනයට ඇතුලත් වීම අත්‍යවශ්‍ය කටයුත්තකි. 2025 වර්ෂයේ ඡන්දහිමි නාම ලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය මැතිවරණ කොමිෂන් සභාව විසින් මේ වන විටත් ආරම්භ කර ඇත.

එසේම පැෆ්රල් සංවිධානය ද ඡන්දහිමි නාමලේඛනයෙහි ලියාපදිංචිවීමේ අවශ්‍යතාවය පිළිබඳව නිරන්තරයෙන්ම විවිධ ක්‍රම ඔස්සේ ජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන අතර, මෙම ක්‍රියාවලිය සමාජගත කිරීම ඔබ මාධ්‍ය ආයතනයේද වගකීමක් සේ සළකා ඊට ප්‍රමාණවත් ප්‍රචාරණයක් ලබාදීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

එසේම පැෆ්රල් සංවිධානය විසින් මේ සම්බන්ධයෙන් පක්ෂ ලේකම්වරුන් සහ ඔවුන්ගේ පාක්ෂිකයින් දැනුවත් කිරීමට අදාළව යවනු ලබන ලිපියෙහි පිටපතක් ද මේ සමග ඉදිරිපත් කරමි.

ස්තුතියි.
මෙයට විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි,
විධායක අධ්‍යක්ෂ

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com

## ඡන්දය ඔබේ අයිතිය යි. එබැවින් ඔබේ ඡන්ද අයිතිය රැක ගැනීමට අද අදම ක්‍රියාත්මක වන්න.

### ඡන්දහිමි නාම ලේඛන ප්‍රතිශෝධනය 2025

**ඡන්ද හිමියෙකු ලෙස ඔබ ලියාපදිංචි වී ඇත්දැයි පරීක්ෂා කිරීමට මෙය සුදුසුම කාලයයි.**
**ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වීමට අවශ්‍ය මූලික සුදුසුකම්**

- ⇨ ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම
- ⇨ වයස අවුරුදු 18 සම්පූර්ණ වීම
- ⇨ අයදුම්කරුගේ සාමාන්‍ය පදිංචිය

**ඔබට ලියාපදිංචි විය හැක්කේ,**

- ✓ මැතිවරණ කොමිෂමේ https://eservices.elections.gov.lk/pages/home.aspx සබැඳිය ඔස්සේ මාගර්ගත ක්‍රමයට

- ✓ අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මුණ ගැසීමෙන්

## ඔබ ලියාපදිංචි වී ඇත් දැයි පරීක්ෂා කළ හැක්කේ,

**කුමන කාල සීමාවේ ද? 2025 ජූලි 11 වන දා සිට 2025 අගෝස්තු 07 වන දින දක්වා**

**කුමන ස්ථානවලින් ද?**

- මැතිවරණ කොමිසමේ https://eservices.elections.gov.lk/pages/home.aspx සබැඳිය ඔස්සේ මාගර්ගත ක්‍රමයට
- දිස්ත්‍රික් මැතිවරණ කායර්ාල,
- ප්‍රාදේශීය ලේකම් කායර්ාල,
- ග්‍රාම නිලධාරී කායර්ාලවල මහජන ප්‍රදශර්නයට තබා ඇති "අ" සහ "ආ" ලැයිස්තු මගින්

**ලියාපදිංචි වී ඇත්දැයි පරීක්ෂා කිරීමෙන් පසු**

- ඔබේ හෝ ඔබගේ පවුලේ කෙනෙකුගේ නම ඊට ඇතුළත් වී නැත්නම්
- ඔබ ඇතුළත් නොකළ වෙනත් නම් ඊට ඇතුළත් වී ඇත්නම්
- ඔබේ නම වෙනත් ලැයිස්තුවක ඇතුළත් වී ඇත්නම්

**එසේ නැතහොත්**

- වෙනත් ප්‍රදේශයක අයෙකු ඔබේ ප්‍රදේශයේ පදිංචි ලැයිස්තුවට ඇතුළත් වී ඇත්නම්

**කළ යුත්තේ කුමක්ද?**

- ❖ වහාම එය නිවැරදි කිරීම සඳහා ඔබේ ග්‍රාම නිලධාරී මුණගැසී අදාළ හිමිකම් පෑමේ ආකෘති පත්‍රයක් හෝ විරෝධතා පෑමේ ආකෘති පත්‍රයක් පුරවා තම දිස්ත්‍රික්කයේ සහකාර/ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයාට භාර දීමයි.

- ❖ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය සම්බන්ධයෙන් ඔබට යම් ගැටළුවක් ඇත්නම් කතා කරන්න අදම පැෆ්රල් විශේෂ පහසුකාරක මධ්‍යස්ථානයට

**පැෆ්රල් විශේෂ පහසුකාරක මධ්‍යස්ථානය**

දුරකථන - 011-2558570/71
ෆැක්ස් - 011-2558572
ජංගම / වට්ස්ඇප් - 0704232688
ඊමේල් - paffrel@sltnet.lk
ලිපිනය - පැෆ්රල් සංවිධානය,
නො. 16, බයර් ඩ් පෙදෙස,
පාමංකඩ පාර,
කොළඹ 06.

2025-06-16
ලේකම්,
..............................................,

ගරු ලේකම් තුමනි,

ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය 2025

—අ" සහ "ආ" ලැයිස්තු ප්‍රදර්ශනය කාල සීමාව

ඡන්ද හිමියන් වීමට සුදුසුකම් ලබන සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ නම් ඡන්දහිමි නාමලේඛනයට ඇතුලත් වීම අත්‍යාවශ්‍ය කටයුත්තකි. මැතිවරණ කොමිෂන් සභාව මගින් සෑම වර්ෂයකම පෙබරවාරි 01 දින ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය ආරම්භ කරනු ලබයි. ඒ අනුව 2025 වර්ෂය සඳහා ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය 2025 පෙබරවාරි 01 දින ආරම්භ වූ අතර 2025 මැයි 31 දිනෙන් අවසන් විය.

එහෙත් මෙකී ක්‍රියාවලියෙහි "අ" සහ "ආ" ලැයිස්තු ප්‍රදර්ශනය 2025 ජූලි 11 වන දින සිට 2025 අගෝස්තු 07 වන දින දක්වා ක්‍රියාත්මක වේ. එම ලැයිස්තු මැතිවරණ කොමිෂන් සභාවේ මාර්ගගත ක්‍රමය ඔස්සේ ද, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාලවල මහජන ප්‍රදර්ශනයට තබා ඇති බැවින් 2025 ඡන්දහිමි නාමලේඛනයට ඔබේ නම ඇතුලත් වී ඇත්දැයි ඒ හරහා පරීක්ෂා කර බැලිය හැක.

එසේ පරීක්ෂා කිරීමෙන් අනතුරුව මූලික සුදුසුකම් සපුරා ඇති අයට 2025 ඡන්ද හිමි නාම ලේඛනයට නම ඇතුලත් වී නොමැති නම් හිමිකම් පෑමේ ආකෘති පත්‍රයක් ලබාදීමෙන් අවසන් අදියරේ වුවද ලියාපදිංචි වීමට හැකියාව ඇත.

එබැවින් මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙනුත්, අදාළ දින වකවානු සම්බන්ධයෙනුත් (ඔබ"අ" සහ "ආ" ලැයිස්තු ප්‍රදර්ශනය 2025 ජූලි 11 වන දින සිට 2025 අගෝස්තු 07 වන දින) ඔබගේ පක්ෂයේ, අපේක්ෂකයන් පාක්ෂිකයන් දැනුවත් කරන ලෙසත්, මෙම අවසන් අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගන්නා ලෙසත් අපි අවධාරණය කරමු.

මැතිවරණයකදී එක් ඡන්දයකින් වුවද සාධනීය බලපෑමක් රටටත්, ජනතාවටත් සිදුවන බැවින් මේ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

ප්‍රතිශෝධන ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඔබට හෝ ඔබ පක්ෂයේ අපේක්ෂකයින් , පාක්ෂිකයන්ට යම් ගැටළුවක් වේ නම් පැෆ්රල් විශේෂ පහසුකාරක මධ්‍යස්ථානය අමතන මෙන් දන්වා සිටින අතර ඊට අදාළ තොරතුරු පහතින් දක්වමු.

පැෆ්රල් විශේෂ පහසුකාරක මධ්‍යස්ථානය
දුරකථන - 011-255857/71
ෆැක්ස් - 011-2558572
ජංගම / වට්ස්ඇප් - 0704232688
ඊමේල් - paffrel@sltnet.lk

ලිපිනය - පැෆ්රල් සංවිධානය,
නො. 16" බයර්ඩ් පෙදෙස, පාමංකඩ පාර,
කොළඹ 06

ස්තුතියි.
මෙයට විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි,
විධායක අධ්‍යක්ෂ.